කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී ප්‍රථම වසර උපාධි පරීක්ෂණය

දෙවන සෙමෙස්තරය - 2017/2018

**CMS 1202 – ජනමාධ්‍ය හා නිර්මාණාත්මක කලා අධ්‍යයන ප්‍රවේශය**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

01. 'මුල්කාලීන සිංහල පුවත්පත් හුදු තොරතුරු සන්නිවේදනයෙන් ඔබ්බට ගිය සමාජ, සංස්කෘතික හා ආගමික කාර්යභාරයක් ද ඉටු කර තිබේ.' උදාහරණ සහිත ව විමසන්න.

02. තාක්ෂණයේ අභිවර්ධනය සමග ලෝක පුවත්පත් කලාවේ දක්නට ලැබෙන සුවිශේෂී වෙනස්කම් පැහැදිලි කරන්න.

03 'සිනමා මාධ්‍යය ප්‍රභවය ලබන්නේ විවිධ පර්යේෂණ හා අනාවරණවල ප්‍රතිඵල වශයෙනි.' සිනමාවේ ප්‍රභවය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක දක්වමින් විවරණය කරන්න.

04. ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් නිර්මාණය කර ගැනීම සඳහා පොදු සේවා ගුවන්විදුලියේ දායකත්වය එහි අරමුණු ඇසුරින් සාකච්ඡා කරන්න.

05. 'ගුවන්විදුලිය ශ්‍රාවකයාගේ පරිකල්පන ශක්තිය පුළුල් කරයි.' ගුවන්විදුලි මාධ්‍යයට අයත් ප්‍රබලතා කෙරෙහි සාවධාන ව විග්‍රහ කරන්න.

06. රූපවාහිනී මාධ්‍යයේ ජනප්‍රියත්වය ස්ථාවර ව පවත්වා ගැනීම සඳහා එහි තාක්ෂණික සහ මාධ්‍ය ප්‍රවණතා හේතු වී ඇති ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

07. නව මාධ්‍ය හේතු කොටගෙන සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පැවති දුරස්ථභාවය අවම වී ඇති අතර ඉතා ශීඝ්‍රයෙන් තොරතුරු හුවමාරු වෙයි. මෙම තත්ත්වය වර්තමාන සන්නිවේදකයන්ට හා ග්‍රාහකයන්ට වැදගත් වන්නේ කෙසේදැයි විමසන්න.